**පොල් වගාකිරීමේ මණ්ඩලය - 2017**

---------------------------------------------

පොල් වගාකිරීමේ මණ්ඩලයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ 43 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

--------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

-------------------

## 2.1 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට පොල් වගා කිරීමේ මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------------

### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

-----------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01

-----------------------------------------------------

ප්‍රමිතයේ 48 ඡේදය අනුව, අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර වත්කම් හා වගකීම් හිලව් නොකල යුතු වුවද ආදර්ශ පොල් උයන් වෙත ගෙවිය යුතු ශේෂය වන රු.15,410,650 ක් හා තවාන් වලින් ලැබිය යුතු ශේෂය වන රු. 6,609,604 ක් එකිනෙකට හිලව් කර ශුද්ධ අගය වන රු.8,801,046 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් යටතේ ඍණ අගයක් ලෙස දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02

-----------------------------------------------------

(i) සමාලෝචිත වර්ෂයේ ආදර්ශ පොල් උයන් සඳහා වූ බදු වෙන් කිරීම් රු. 138,785 ක් සහ මුදලින් ගෙවන ලද රු.38,785 ක් වූ බදු මුදල්, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට ඇතුලත් කර නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ පොළී ආදායම ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ රු.45,235,649 ක් දක්වා තිබූ නමුත් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ එය රු.43,136,912 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය රු.2,098,737 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(iii) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව ගෙවිය යුතු දැ හි වැඩිවීම රු.75,474,232 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ එය රු. 68,541,914 ක් ලෙස දැක්වීම හේතුවෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වන මුදල් ප්‍රවාහය රු.6,932,318 කින් අඩුවෙන් දක්වා තිබුණි.

**(ඇ)** ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

-----------------------------------------------

ප්‍රමිතයේ 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.140,146,793 ක් වූ මෝටර් රථ 239 ක් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් භාවිතා කරමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

සමාලෝචිත වර්ෂය තුලදී මණ්ඩලය වෙත භාණ්ඩාගාර සහ අමාත්‍යාංශ ප්‍රදාන ලෙස රු.මිලියන 1,463 ක් ලැබී තිබූ නමුත් එම ප්‍රදාන ක්‍රමාණුකූල පදනමක් මත විලම්භිත ආදායමක් ලෙස හඳුනාගැනීම සඳහා ගිණුම් ප්‍රතිපත්තියක් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයේ ණය හිමි ශේෂයක් වූ රු.7,596,568 ක් එම වසරේ ආදායමක් ලෙස හඳුනා නොගැනීම නිවැරදි කිරීම සඳහා සමුච්චිත ලාභයට ගැලපීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ ණය හිමියෙකු ලෙස දක්වා තිබුණි.

(ආ) ත්‍රිකුණාමලයේ නිල නිවාසයක් ඉදිකිරීම වෙනුවෙන් කොන්ත්‍රාත් ණය හිමියන්ට ගෙවා තිබූ රු.3,588,212 ක් එම ණය හිමි ගිණුම හර කිරීම වෙනුවට නොනිමි වැඩ ගිණුමට හර කර තිබුණි.

(ඇ) අනුරාධපුර කටුකැලියාව සංචාරක නිවාසය ඉදිකිරීමට අදාලව රු. 491,215 ක් ගොඩනැගිලි ගිණුමට හා ණය හිමි ගිණුමට වැඩියෙන් ගිණුම්ගත කිරීම හේතුවෙන් එම ගිණුම් වල ශේෂය එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි. තවද, මේ හේතුවෙන් ගොඩනැගිලි ක්ෂය රු.124,822 ක්ද වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයේදී කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු මුදල් නිරවුල් කිරීමේදී සාවද්‍ය ලෙස නොනිමි වැඩ ගිණුමට හර කර තිබූ රු. 844,253 ක් සමාලෝචිත වර්ෂයේදී නිවැරදි කිරීමේදී ණය හිමියන්ට හර කිරීම වෙනුවට සමුච්චිත ලාභයට හර කර තිබීම හේතුවෙන් ණයහිමියන් එම වටිනාකමින් වැඩියෙන් සහ සමුච්චිත ලාභය අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) වාහන අළුත්වැඩියා සඳහා දරන ලද රු.641,390 ක වියදමක් මෝටර් රථ වාහන ගිණුමට හර කර තිබුණි.

### 2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසන් දිනට පොල් වගා කිරීමේ මණ්ඩලය විසින් පොල් පර්යේෂණ මණ්ඩලයට ගෙවිය යුතු ශේෂය රු.31,802,639 ක් ලෙස දක්වා තිබුණද පොල් පර්යේෂණ මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුව පොල් වගා කිරීමේ මණ්ඩලයෙන් ලැබිය යුතු ශේෂය රු. 5,210,217 ක් ලෙස දක්වා තිබුණි.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට විගණිත මූල්‍ය ප්‍රකාශන අනුව සමුච්චිත අරමුදලේ ශේෂය රු.712,876,018 ක් වුවද එය 2017 ජනවාරි 01 දිනට රු.705,943,698 ක් ලෙස ඉදිරියට ගෙන ඒම හේතුවෙන් රු.6,932,320 ක පැහැදිලි නොකල වෙනසක් විය.

(ඇ) මූල්‍ය ප්‍රකාශන අනුව, ජෝන් කීල්ස් ආයතනය වෙත ගෙවිය යුතු මුදල රු.5,119,000 ක් වුවද, එම ආයතනයේ ශේෂ සනාථ කිරීම් අනුව ගෙවිය යුතු මුදල රු.500,500 ක් වුයෙන් රු. 4,618,500 ක වෙනසක් පැවතුණි.

(ඇ) කප්රුක ඇප ආවරණ ආයෝජනවල 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය රු. 1,337,340 ක් වූ අතර ශේෂ සනාථන අනුව එම ශේෂය රු. 1,328,041 ක් වූයෙන් රු. 9,299 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රධාන කාර්යාලයේ පාරිතෝෂික වෙන් කිරීම් උපලේඛන අනුව පාරිතෝෂික ශේෂය රු.168,681,558 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන අනුව එම වටිනාකම රු.159,339,824 ක් වූයෙන් රු.9,341,734 ක වෙනසක් වූ අතර, එම වෙනස සැසඳීම් කර නොතිබුණි.

**2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම්**

-----------------------------------

ආදර්ශ පොල් උයන් ගිණුම්වල ආරම්භක බීජ පොල් තොග ශේෂයෙන් රු.888,642 ක ශේෂය ගැලපීමට අදාළ ජ’නල් වවුචර් විගණනය වෙත ඉදිරිපත් නොවීය.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට රඳවා ගත් මුදල් ලෙස රු.1,260,899 ක ශේෂයක් වසර පහකට වඩා වැඩි කාලයක සිට පැවති අතර එම ශේෂය නිරවුල් කිරීමට හෝ මණ්ඩලයේ ආදායමක් ලෙස හඳුනා ගැනීමට කටයුතුකර නොතිබුණි.

(ආ) දැනට සේවයෙන් ඉවත් වී ඇති ගබඩා භාරකරු හා මුදල් අයකැමි වශයෙන් සේවය කරන ලද සේවකයන් අට දෙනෙකුගෙන් 1979 වර්ෂයේ සිට 1992 වර්ෂය දක්වා ලබාගෙන තිබූ ආරක්ෂිත තැන්පතු රු. 518,046 ක් නිරවුල් කිරීමට කටයුතු නොකර අඛණ්ඩව මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙන යමින් පැවතුණි.

(ඇ) වෙළඳ ණය ගැතියන් තුළ ඇතුලත් රු. 2,308,030 ක් වූ මුදල වසර 5 කට වඩා වැඩි කාලයක සිට අය නොවී පැවතුණ අතර එම ශේෂය අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 2017 දෙසැම්බර් 31 දිනට සේවක ණය ප්‍රමාණය රු. 1,218,973 ක් වූ අතර, එම ශේෂයෙන් අය නොවී පැවති වසර 5 කට වැඩි සේවක ණය ප්‍රමාණය රු.341,496 ක් වූ අතර එම ශේෂ අයකර ගැනීමට සුදුසු වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඉ) ගොඩනැගිලි දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු රු. 372,538 ක ශේෂය සහ පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයෙන් ලැබිය යුතු රු.6,573,572 ක ශේෂය වසර 4 කට වැඩි කාලයක අය නොවී පැවතුණි.

(ඊ) 2009 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළිය ලෙස මූල්‍ය ප්‍රකාශනවල පැවත එන රු.26,522 ක් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(උ) ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘතිය යටතේ පොල් සංවර්ධන නිලධාරීන් වෙත යතුරු පැදි මිලදී ගැනීමට ලබා දුන් ණය මුදලින් අය කරගෙන තිබූ රු.936,492 ක ශේෂයක් වර්ෂ පහකට වඩා වැඩි කාලයක සිට නිරවුල් කිරීමකින් තොරව ජංගම වගකීම් යටතේ දක්වා තිබුණි.

(ඌ) යාපනය ප්‍රාදේශීය කාර්යාලයෙන් 2015 වර්ෂයේදී දිවිනැගුම ජාතික වැඩසටහන යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට ලබාදී ඇති පොල් පැළ සඳහා අයවිය යුතු රු.4,445,975 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.4 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

මූල්‍ය වටිනාකම රු.563,336,141 ක් වූ ජ’නල් වවුචර් 13 ක් අනුමැතියකින් තොරව මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කර තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.20,936,962 ක ඌනතාවයක් වූ අතර, එයට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 265,079,686 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.286,016,648 ක පිරිහීමක් විය. සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශ ප්‍රතිපාදන රු.176,142,677 කින් අඩුවීම සහ ආදර්ශ පොල් උයන් වල ලාභය රු.121,369,553 කින් අඩුවීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයෙහි පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 සහ 2014 වර්ෂයන්හිදී පිළිවෙලින් රු.71,772,762 ක සහ රු.34,890,412 ක අතිරික්තයක් පැවති අතර, 2015 වර්ෂයේදී රු.36,341,560 ක ඌනතාවයක් ඇති වී තිබුණි. නැවත 2016 වර්ෂයේදී රු.265,079,686 ක අතිරික්තයක් ඇති වී තිබූ නමුත් සමාලෝචිත වර්ෂයේදී රු.20,936,962 ක ඌනතාවයක් ඇති වී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂයවීම් නැවත ගැලපීමෙන් පසු 2013 වර්ෂයේදී රු.348,403,288 ක ධන අගයක් වූ ආයතනයේ දායකත්වය 2014, 2015 හා 2016 වර්ෂයන්හිදී පිළිවෙලින් රු.344,765,825 ක්, රු.347,184,286 ක් , රු.654,627,066 ක් දක්වා වර්ධනය වී තිබුණද, සමාලෝචිත වර්ෂයේදී රු.372,748,791 ක් දක්වා අඩුවී තිබුණි.

**3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව, මණ්ඩලයේ ජංගම වත්කම් අනුපාතය 2017 හා 2016 වර්ෂවලදී පිළිවෙලින් 3.74 ක් හා 6.31 ක් වූ අතර ක්ෂණික අනුපාතය පිළිවෙලින් 1.08 ක් හා 1.9 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව එම අනුපාතවල පිරිහීමක් ඇති වී තිබුණි. එමෙන්ම ඉකුත් වර්ෂයේ සියයට 16 ක් වූ මණ්ඩලයේ ශුද්ධ ලාභ අනුපාතය සමාලෝචිත වර්ෂයේදී සියයට 1.43 ක සෘණ අගයක් ගෙන තිබුණි.

**3.3 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සේවකයන් හත්දෙනෙකු හා සහ බාහිර පාර්ශවයේ දෙදෙනෙකු විසින් මණ්ඩලයට එරෙහිව අධිකරණවල නඩු පවරා තිබුණු අතර ඉන් තිදෙනෙකු විසින් සේවයෙන් පහ කිරීම සහ කළමනාකරණය විසින් අපහාස කිරීම මත රු.11,328,805 ක සහ මණ්ඩලයේ රියදුරෙකු විසින් සිදුකරන ලද රිය අනතුරක් වෙනුවෙන් රු.1,000,000 ක වන්දි ඉල්ලා මණ්ඩලයට එරෙහිව නඩු පවරා තිබුණි.

(ආ) මණ්ඩලය විසින් බාහිර පාර්ශවයන් දෙදෙනෙකුට සහ සේවකයෙකුට එරෙහිව එකතුව රු.4,555,819 ක වන්දි ඉල්ලා අධිකරණයේ නඩු පවරා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය
-----------------------------

### 4.1 කාර්යසාධනය
-------------------

#### 4.1.1 ක්‍රියාකාරීත්වය සහ සමාලෝචනය
-----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේදී රෝග හා පලිබෝධ මර්ධනය යටතේ කළු කුරුමිණි මර්ධන පෙරමෝන වයල් 2,000 ක් බෙදා දීමට සැලසුම් කර තිබුණද, අවශ්‍යතාවය හඳුනා ගෙන ඒවා කඩිනමින් ඇණවුම් කර ප්‍රමාදයකින් තොරව බෙදා දීමට කටයුතු කර නොතිබූ අතර වයල් 500 ක් පමණක් බෙදා දී තිබුණි.

(ආ) 2017 වර්ෂය තුලදී නව වගා / නැවත වගා / යටි වගා වැඩ සටහන් යටතේ තැඹිලි පැළ 13,700 ක් ක්‍රමානුකූලව වගා කිරීමට සැලසුම් කර තිබුණ ද වගාකොට ඇත්තේ තැඹිලි පැළ 2,163 ක් පමණක් වූ අතර මණ්ඩලය විසින් උසස් තත්ත්වයේ තැඹිලි බීජ හඳුනාගෙන වගා කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ලේනව, මුන්දලම, කොහොඹාන, පලෙයි සහ කොරෙයි යන ආදර්ශ පොල් උයන්වල මයිටා විලෝපිතයන් යෙදීමේ ප්‍රගතිය සියයට 10 ත් 36 ත් අතර විය. මයිටා හානිය වැළැක්වීමට මයිටා විලෝපිතයන් නොයෙදීම හේතුවෙන් මයිටා හානි පොල් ප්‍රමාණය වැඩි වී ඇති අතර මණ්ඩලයේ ස්ථාපිත මයිටා විද්‍යාගාරවල විලෝපිත මයිටා පැකට් නිෂ්පාදනය වැඩිකිරීමට සහ විලෝපිත මයිටා පැකට් යෙදීම සඳහා පුහුණු සේවකයන් බඳවා ගැනීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්
------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 වර්ෂය තුලදී බඳුන් පැල 1,802,654 ක ප්‍රමාණයක් නිෂ්පාදනය කිරීමට සැලසුම් කර තිබුණද නියමිත වේලාවට ප්‍රසම්පාදන කටයුතු සිදු නොකිරීම, සැපයුම්කරුවන් විසින් නිසි කලට පොලි බෑග් නොසැපයීම, ප්‍රමිතියෙන් බාල පොලි බෑග් සැපයීම යන හේතූන් මත සත්‍ය වශයෙන් සිටුවා ඇති බඳුන් පැල ප්‍රමාණය 659,332 ක් පමණක් විය. ඒ අනුව බඳුන් පැල වශයෙන් සිටුවීමට අපේක්ෂිත පොල් පැල 1,143,322 ක ප්‍රමාණයක් බිම් පැල වශයෙන් සිටුවීමට සිදුවී තිබූ අතර මේ හේතුවෙන් උපයාගත හැකිව තිබූ ආදායම් මණ්ඩලයට අහිමි වී තිබුණි.

(ආ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2017 ජනවාරි 03 දිනැති අංක පීඊ/එන්බීඊ/සීසීබී/ජීඊඑන්/2016 දරන ලිපිය මගින් මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ මාසිකව රු.120,000 ක් බැගින් සංචිත වාහන 04 ක් ලබාගැනීමට අනුමැතිය ලබා දී තිබුණි. එහෙත් මාසික වාරිකය රු.165,000 ක් බැගින් ගෙවා තිබීම හේතුවෙන් රු.180,000 ක මුදලක් අතිරේකව මාසිකව ගෙවීමට සිදුවී තිබූ අතර මෙම වාහන සංචිත වාහන ලෙස ධාවනයේ නොයොදවා නිලධාරීන්ට වෙන් කළ වාහන ලෙස ධාවනයේ යොදවා තිබුණි.

(ඇ) පිරිවැය රු.මිලියන 55 ක්වූ මීගමුව බීජ පොල් ඒකකයේ නව කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු පිළියෙල කිරීම සඳහා උපදේශක සමාගමකට රු.2,149,974 ක මුදලක් ගෙවා තිබුණද, සුදුසු කොන්ත්‍රාත්කරුවකු තෝරා ගැනීමට කළමනාකරණය අවශ්‍ය කටයුතු සිදු නොකිරීම හේතුවෙන් 2018 අගෝස්තු 30 දක්වා ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි.

(ඇ) ශේෂය රු.433,039 ක් වූ බැංකු ගිණුම් 3 ක් වසර 6 කට ආසන්න කාලයක සිට අක්‍රීයව පැවති අතර එම ගිණුම් පියවා දැමීමට කළමනාකරණය විසින් කටයුතු කර නොතිබුණි.

**4.3 අත්හැර දැමූ ව්‍යාපෘති**

කුරුණෑගල නිල නිවාසයේ ඉදිකිරීම් කටයුතු සඳහා රු.2,838,619 ක් වැයකර තිබූ නමුත් 2015 වර්ෂයේ සිට එම ඉදිකිරීම් අත්හැර දමා තිබුණි.

**4.4 කාර්යමණ්ඩල පරිපාලනය**

2017 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ අනුමත සහ තථ්‍ය කාර්ය මණ්ඩලය පිළිවෙලින් 925 ක් සහ 637 ක් වූයෙන් කාර්ය මණ්ඩලයේ 288 දෙනෙකුගේ පුරප්පාඩු පැවතුණි. තවද, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව ආදර්ශ පොල් උයන් සඳහා නිලධාරීන් 110 ක් මණ්ඩලය විසින් බඳවා ගෙන තිබුණි.

## 5. තිරසාර සංවර්ධනය

**5. 1 තිරසාර සංවර්ධන අරමුණු ලඟා කර ගැනීම**

තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර ඒ අනුව මණ්ඩලය විසින් තම විෂය පථයට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද, යන්න පිළිබඳව දැනුවත් වී තිබූ අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පොල් වගාවේ කාර්යසාධනය මැනීම සඳහා දත්ත පදනමක් පවත්වගෙන නොයාම හේතුවෙන් ඉහත පරිදි කාර්යසාධනය මැන බැලීම සඳහා වන දර්ශකයක් හඳුනා ගැනිමට නොහැකි වී තිබුණි.

(ආ) තිරසාර සංවර්ධන ඉලක්ක කරා ලඟා වීම සඳහා මණ්ඩලය විසින් හඳුනා ගත් කාර්යයන් වාර්ෂික සැලැස්මට ඇතුලත් කර නොතිබූ අතර එම කාර්යයන් ඉටු කිරීමට අවශ්‍ය වන මූල්‍ය ප්‍රතිපාදනයන් වාර්ෂික අයවැයට ඇතුලත් කර නොතිබුණි.

(ඇ) තිරසාර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් මණ්ඩලයේ කාර්ය භාරය සම්බන්ධව උනන්දුවක් දක්වන පාර්ශවයන් ලෙස සුළු හා මධ්‍යම පරිමාණ වගාකරුවන් හඳුනා ගත හැකි වුවද මණ්ඩලය විසින් ඔවුන් හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 6. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

**6.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2003 ජුනි 02 දිනැති පීඊඩී/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුලත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කල යුතු වුවත්, මණ්ඩලය විසින් ගිණුම් ඉදිරිපත් කර තිබුණේ මාස 03 ක පමණ ප්‍රමාදයකින් පසුව 2018 මැයි 30 වන දිනය.

## 6.2. ප්‍රසම්පාදනයන් සහ කොන්ත්‍රාත් ක්‍රියාවලිය

### 6.2.1 ප්‍රසම්පාදනයන්

වටිනාකම රු. 7,461,500 ක්වූ සූර්ය බල පද්ධතියක් සමාලෝචිත වර්ෂයේදී ස්ථාපිත කර තිබුණද, එය ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

### 6.2.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

2015 වර්ෂයේදී ආරම්භ කර තිබූ කොන්ත්‍රාත් වටිනාකම රු.36,726,905 ක් වූ මාතලේ ප්‍රාදේශීය කාර්යාල නව දෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව 2017 ජුලි 04 දින නිම කිරීමට නියමිතව තිබූ අතර මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) දෙමහල් ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු එක් කොන්ත්‍රාත්තුවක් ලෙස නොපවරා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.4 ඡේදයට පටහැනි ලෙස මහල් දෙක අදියර දෙකකට වෙන්කර කොන්ත්‍රාත් දෙකක් ලෙස එකම කොන්ත්‍රාත්කරුවෙකුට පවරා තිබුණි.

(ආ) කොන්ත්‍රාත් ගිවිසුමේ සඳහන් පරිදි නියමිත කාලය තුල අවසන් නොකිරීම නිසා ගිවිසුම් ප්‍රකාරව කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 10 ක උපරිමයකට යටත්ව රු.3,672,710 ක ප්‍රමාද ගාස්තුවක් අය කර නොතිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | (i) ජ'නල් වවුචර් අනුමත නොකිරීම.<br>(ii) ඇතැම් රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය නොකිරීම. |
| (ආ) මෙහෙයුම් පාලනය | (i) වැඩි අස්වැන්නක් ලබාගත හැකි බීජ තවාන් නොකිරීම, අසාර්ථක පැල උඟුලා නොදැමීම හා තවාන් නිසි පරිදි නඩත්තු නොකිරීම.<br>(ii.) නියමිත ගස් ගණන පවත්වා ගැනීම හා පොල් වගාව නඩත්තු කිරීම. |
| (ඇ) මානව සම්පත් කළමනාකරණය | පුරප්පාඩු පවතින තනතුරු සඳහා සුදුසු සේවකයන් බඳවා නොගැනීම. |